ප්‍රවෘත්ති නිවේදනය | ஊடக வெளியீடு | PRESS RELEASE

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு

Ministry of Health & Mass Media

No. 385, Ven. Baddegama Wimalawansa Thero Mawatha, Colombo - 10
Tel: off: 2671181 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540

2025.04.22

| 04 | 18 |
|---|---|

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / ප්‍රවෘත්ති කර්තෘ / ප්‍රවෘත්ති සංස්කාරක,

**පහත සදහන් ප්‍රවෘත්තියට ඔබ මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.**

## "සුවසිරිපා බක්මහ උදානය" මේ මස 25 වන සිකුරාදා ...

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් උදා වූ නව වසර සැමරීම වෙනුවෙන් පවත්වනු ලබන **සුවසිරිපා බක්මහ උදානය මේ මස 25 වන සිකුරාදා** දින දවස පුරා එම අමාත්‍යාංශ පරිශ්‍ර යේ පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ඇත.

ගම හරහා දිවීම, නීරෝගීමත් පුද්ගලයා තේරීම, ජනකවි, දුර්ලභ ඖෂධ පැලෑටියේ නම සෙවීම, අලියාට ඇස තැබීම, බනිස් කෑමේ තරගය, කොට්ට පොර, කඹ ඇදීම, අවුරුදු කුමරා කුමරිය තේරීම,රබන් ගැසීම, සැගවුනු අමුත්තා සෙවීම, විවිධ ඇඳුම් තරඟය,ඉදිකටුවට නූල දැමීම, බැලුන් පිපිරවීම, බාධක දිවීම, සංගීත තොප්පි තරඟය සහ බිත්තර ඇල්ලීම ඇතුළුව තවත් සම්ප්‍රදායික ජන ක්‍රීඩා හා විනෝදාත්මක ක්‍රීඩා රැසක් සමගින් සුවසිරිපා බක්මහ උදානය එදින පැවැත්වීමට නියමිතය.

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සුභ සාධක සංගම මගින් මෙම බක්මහ උළෙළ සංවිධානය කරනු ලබයි.

ලක්ෂ්මේන්ද්‍ර දමයන්තකුමාර තෙන්නකෝන්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවෘත්ති හා ප්‍රචාරණ)
සෞඛ්‍ය අමාත්‍යාංශය